**IPRC/16/248**

# ජාතික ආණ්ඩු ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ යහපාලන සමාජයක් පිහිටුවීමට දක්වන දායකත්වය පිළිබඳ ජනතා ආකල්ප (ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

හිමාෂා පෙරේරා[1*]

2015 ජනවාරි මස 8 වන දින යහපාලන සමාජයක් ශ්‍රී ලංකාව තුළ තහවුරු කරන බවට වූ දේශපාලන පොරොන්දුව මත මෛත්‍රීපාල සිරිසේන මහතා ජනපතිවරණ තරඟ බිමට අවතීර්ණ විය. එහිදී සිය විරුද්ධ පිළ නියෝජනය කළ මහින්ද රාජපක්ෂයන් පරාජය කරමින් 51.28%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමට එතුමා සමත් විය. කෙසේ වෙතත් එතුමාගේ මූලිකත්වය යටතේ පසුකාලීන ව 2015 මැයි 15 වන දින සම්මත කරන ලද 19 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 45(6), 45(5) වගන්ති යටතේ ජාතික ආණ්ඩු ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ කොන්දේසි ඉදිරිපත් කර ඇත. 2015 අගෝස්තු මස 17 වන වන දින පවත්වන ලද 15 වන පාර්ලිමේන්තු මැතිවරණයේ කිසිඳු දේශපාලන පක්ෂයක් ආණ්ඩුවක් පිහිටු වීමට තරම් ප්‍රමාණවත් ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමට අසමත් වූ අතර, එක්සත් ජාතික පක්ෂය විසින් මැතිවරණයට පෙර ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කර තිබූ පරිදි ජාතික ආණ්ඩුවක් පිහිටුවීමට පාර්ලිමේන්තුවේ අනෙකුත් පක්ෂවලට ආරාධනා කරන ලදි. එම ආරාධනාව පිළිගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජාතික පක්ෂය අවබෝධතා ගිවිසුමක් මගින් ජාතික ආණ්ඩු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට  අවශ්‍ය පසුබිම සකසන ලදි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ, ජාතික ආණ්ඩු ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ යහපාලන ගුණාංගවලින් සපිරි සමාජයක් බිහි කිරීමට දක්වන දායකත්වය පිළිබඳ ජනතා ආකල්ප පිරික්සීමයි. අධ්‍යයන ප්‍රදේශය වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ  ජා-‑.ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තෝරා ගත් අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනගහනය අතුරින් පනස්දෙනෙකු අධ්‍යයන නියැදිය ලෙස අහඹු ලෙස තෝරා ගැණිනි. අධ්‍යයනය ප්‍රාථමික සහ ද්විතියික මූලාශ්‍ර මත පදනම් වූ අතර ප්‍රාථමික දත්ත සහ තොරතුරු ලබා ගැනීමේ දි ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා උපයෝගී කරගැණිනි. පර්යේෂණයේ ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යානමය විධික්‍රම ඔස්සේ ද ගුණාත්මක දත්ත සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය සහ විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ ද විශ්ලේෂණය කරන ලදී. මෙම අධ්‍යයනයේ දී ප්‍රතිචාරීන්ගෙන් 40%ක් ප්‍රකාශ කළේ ජාතික ආණ්ඩු සංකල්පය යහපාලන සමාජයක් පවත්වාගෙන යාමට අනුචිත බවයි. එසේම, 20% එය ශ්‍රී ලංකාවවට උචිත ප්‍රතිපත්තියක් බව ද, 10%ක්  ජාතික ආණ්ඩු ප්‍රතිපත්තිය සබැඳිව තමන් සතුව දැනුමක් නොමැති බව ද, 30%ක්  ජාතික ආණ්ඩු ප්‍රතිපත්තිය යහපත් වූව ද, එය ශ්‍රී ලංකාවේ යහපාලන සමාජයක් ගොඩනැඟීමට අනුචිත බව ද, ප්‍රකාශ කරන ලදි. අධ්‍යයනයේ නිගමනය වන්නේ ජාතික ආණ්ඩු සංකල්පය ශ්‍රී ලංකාවේ  යහපාලන සමාජයක් ගොඩනැඟීමට එතරම්  සුදුසු නොවන බවයි.

***ප්‍රමුඛ පද:*** *රාජ්‍ය ප්‍රතිපත්තිය, ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ජනපතිවරණය, යහපාලනය, ජාතික ආණ්ඩුව.*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. *himashaperera91@gmail.com